# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## ලංසු කැඳවීමේ නිවේදනයට අතිරේකය (IFB)

## ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

IWWRMP

**ව්‍යාපෘති අංකය: P166865, ණය අරමුදල් අංකය: IDA-66190-LK/IDA-66210-LK**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් (IDA) මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර, එම ණය මුදලින් කොටසක් පහත සටහනේ දැක්වෙන කොන්ත්‍රාත් යටතේ ගෙවීම් සඳහා යෙදවීමට අදහස් කරයි.

මෙම අතිරේකය මගින් 2026 ඔක්තෝබර් 23 වන දින ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල පළ වූ "ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සඳහා ගිනි නිවීමේ උපකරණ මිලදී ගැනීම" සහ "පරීක්ෂණ පොම්පකරන ඒකක (Test Pumping Unit) සහ ඊට අදාළ උපාංග මිලදී ගැනීම සහ සැපයීම – නැවත ලංසු කැඳවීම" සඳහා වන මුල් ලංසු කැඳවීමේ නිවේදනය සංශෝධනය කරයි. මෙම අතිරේකයේ සියලුම අවශ්‍යතා ලංසු ලේඛනයේ සහ ඊට අදාළ ගිවිසුම් ලේඛනවල කොටසක් ලෙස මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| අනු අංකය | කාර්ය විස්තරය | කොන්ත්‍රාත් අංක | සටහන |
|---|---|---|---|
| 1 | පරීක්ෂණ පොම්පකරණ ඒකක සහ ඊට අදාළ උපාංග මිලදී ගැනීම සහ සැපයීම – යළි නැවත ටෙන්ඩර් කිරීම. (භාරදීමේ කාලය : දින 60) | LK-MOMDE-367154-GO-RFB | ලංසු ඇපකර වටිනාකම : රුපියල් 447,000.00<br>වලංගු කාලය : දින 147<br>2027.04.09 දින දක්වා ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු: රුපියල් 8,000.00<br>ලංසු අවසන් දිනය : 2026.11.13 දින 14.00 පැය |
| 2 | ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සඳහා ගිනි නිවීමේ උපකරණ ප්‍රසම්පාදනය (භාරදීමේ කාලය : දින 90) | LK-MOMDE-573820-GO-RFB | අර්ධ ලංසුකරණයක් සඳහා අවසර දී ඇත.<br>ලංසු ඇපකරය ඉදිරිපත් කළ මුළු ලංසු මුදලින් 2% සමාන වේ.<br>වලංගු කාලය – දින 147<br>2027.04.09 දින දක්වා<br>ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු : රුපියල් 18,000.00<br>ලංසු අවසන් දිනය : 2026.11.13 දින 15.00 පැය<br>ලංසුකරුවන්ගේ සුදුසුකම් සංශෝධනය කොට ඇත. |

ලංසු තැබීමට පෙර පැවැති රැස්වීමේදී සහ ලංසු ඇගයීම් කමිටුවේදී (BEC) ගන්නා ලද තීරණය අනුව, 1 වන ගිවිසුම සහ 2 වන ගිවිසුම සඳහා ලංසු භාරගැනීමේ අවසන් වේලාව පිළිවෙලින් 2026.11.13 දින 14.00 පැය සහ 15.00 පැය දක්වා දීර්ඝ කර ඇත. ලංසු ඊට පසුව වහාම විවෘත කරනු ලැබේ. ලංසු ලේඛන නිකුත් කිරීමේ කාලසීමාව සාමාන්‍ය වැඩකරන දිනවල 09.30 පැය සිට 14.00 පැය දක්වා වන අතර එය 2025.11.12 දක්වා පමණක් සිදු කෙරේ.

2 වන ගිවිසුම සඳහා (ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සඳහා ගිනි නිවීමේ උපකරණ මිලදී ගැනීම) අර්ධවශයෙන් ලංසු තැබීමට අවසර දී ඇති අතර ලංසු ඇපකරය මුළු ලංසු මිලෙන් 2% දක්වා සංශෝධනය කර ඇත. තවද, 2 වන ගිවිසුම සඳහා වන ලංසුකරුවන්ගේ සුදුසුකම් අවශ්‍යතා ද සංශෝධනය කර ඇත. සංශෝධිත සුදුසුකම් නිර්ණායක, පරීක්ෂා කිරීම සඳහා https://www.iwwrmp.lk/web/procurement/section/procurement-notices වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය**
**2 වන මහල,**
**මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ල,**
**නො. 96,**
**ආනන්ද කුමාරස්වාමී මාවත,**
**කොළඹ 07.**
**2026.11.06**